# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/18 - 2018 අගෝස්තු මස 14 වැනි අඟහරුවාදා - 2018.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නාවූ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2014 ජනවාරි 30 දින අංක 1847/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරනු ලැබූ නියමයට තවදුරටත් වූ වශයෙන් මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි ;

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලය දීර්ඝ කිරීමේ අරමුණින් යුතුව 2014 ජනවාරි 30 දින අංක 1847/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමයේ (4) වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට කියවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''(4) ඉහත කී ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකරගත් ඉහත කී ගිවිසුමේ සඳහන්කර ඇති දින සිට මාස අනූදෙකක් (92) ඇතුළත වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.''

මලික් සමරවික්‍රම, පා.ම.
සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

08 - 1029

1A - PG 4172 — 382 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*